**ජාතික යොවුන් සේනාංකය - 2018**

යොවුන් සේනාංකයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්වය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 සේනාංකයේ වත්කම් හා වගකීම්වල පැවැත්ම

සේනාංකය අවසන්වරට පිළියෙල කරන ලද 2017 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය තත්ත්වය හා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

#### 1.3.1.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| විස්තර | රු. | රු. |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | | 1,800,963,263 |
| ජංගම වත්කම් | | 650,296,889 |
| මුළු වත්කම් | | 2,451,260,152 |
| ජංගම නොවන වගකීම් | 2,090,656,400 | |
| ජංගම වගකීම් | 98,766,550 | |
| මුළු වගකීම් | | (2,189,422,950) |
| ශුද්ධ වත්කම් | | 261,837,202 |

**1.3.1.2 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය**

| විස්තරය | රු. | රු. |
| --- | --- | --- |
| භාණ්ඩාගාර ප්‍රදාන | | 871,546,598 |
| අනෙකුත් ආදායම් | | 124,490,228 |
| මුළු ආදායම | | 996,036,826 |
| මෙහෙයුම් වියදම් | 705,847,321 | |
| තරුණ සංවර්ධන වියදම් | 358,659,502 | |
| මුළු වියදම් | | (1,064,506,823) |
| ඌනතාව | | (68,469,997) |

## 1.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.4.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විදුලිය හා ජල ගාස්තු වෙනුවෙන් බාහිර ආයතනයකින් අයකරගත යුතු සමාලෝචිත වර්ෂය සඳහා රු.2,234,504 ක් ද 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා රු.6,580,871 ක්ද වශයෙන් එකතුව රු.8,815,375ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ඒ ඒ වර්ෂයන් සඳහා අය විය යුතු වටිනාකම් පිළිබඳ එම ආයතනය දැනුවත් කර ඇති අතර, ඉදිරියේදී අදාල ප්‍රතිශතය එම ආයතනය වෙතින් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනිම සඳහා කටයුතු කළ යුතුවීම. |

### 1.4.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී සේනාංකයේ පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීමට අදාල කටයුතුවලට ඉංජිනේරු සේවා සැපයීම වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවියයුතු රු.100,653,154 ක් පියවා නොතිබුණු අතර මෙම වගකීම ගිණුම්වල ද දක්වා නොතිබුණි. | 2019 වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී අදාල ගැලපුම් සිදු කර නිවැරදි කිරීම් සඳහා අවශ්‍ය කටයුතු කරන බව | වගකීම් නිවැරදිව හදුනාගෙන ගිණුම් වල දැක්වීමට හා අදාල ආයතන සමග සාකච්ඡාකර එම වගකීම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත | | | |
| (i) 2(4) වගන්තිය | යොවුන් සේනාංක සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෘත්තිය පුහුණුව, යොවුන් සංවර්ධනය සහ ස්ථාපනය යන කාර්ය සඳහා කමිටු තුනක් පත් කර නොතිබුණි. | අමාත්‍යාංශවල විෂය පථය විටින් විට වෙනස්වීම නිසා පරිපාලනය සඳහා වන කමිටු ක්‍රියාත්මක නොවූ බව. | පරිපාලනය සඳහා වන කමිටු ක්‍රියාත්මක කිරිම සඳහා කටයුතු කළ යුතුවීම. |
| (ii) 19 වගන්තිය | බඳවාගත යුතු පුහුණුලාභීන්ගේ වයස අවුරුදු දහඅටට නොඅඩු සහ විසි අටට නොවැඩි තැනැත්තන් විය යුතු වුවත් අවුරුදු දහඅටට අඩු වයස් සීමාවේ පසුවන්නන් බඳවාගෙන තිබුණි. | පනත සංශෝධනය කර බඳවා ගැනීමේ වයස් සීමාව වයස අවුරුදු 16 දක්වා පුළුල් කිරීමට කටයුතු කරන බව | පනත සංශෝධනය කර නොමැති බැවින් පවතින පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය සංශෝධන පනතේ 8 ඒ වගන්තිය | අදාළ පළාත් පාලන ආයතන වෙතින් ලබාගත යුතු අනුමැතිය ලබා ගැනීමකින් තොරව මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකර තිබුණි . | ඉඩම් නිසි පරිදි පවරා ගන්නා තෙක් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත ඉදිකිරීම් සිදු කළ බව | අදාළ පළාත් පාලන ආයතන වෙතින් අනුමැතිය ගතයුතු වීම. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - මුදල් රෙගුලාසි 264(1) | සෑම ගෙවීමක්ම, වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත්, අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ කුවිතාන්සියකින් තහවුරු විය යුතුය. එහෙත් වෘත්තීය පුහුණුවට අදාලව සමාලෝචිත වර්ෂයේදී කරන ලද ගෙවීම්වලට අදාලව එවැනි කුවිතාන්සියක් ගෙවීම් වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. මේ අනුව | සේනාංකය විසින් වෘත්තීය පුහුණු ආයතනයන් වෙත රේඛිත චෙක්පතක් නිකුත් කරන බවද, සේනාංක පුහුණු මධ්‍යස්ථාන හා වෘත්තීය පුහුණු ආයතනයන් සමඟ ගණුදෙනු කිරීමේදී මෙම ක්‍රියාදාමය සිදු කිරීමේ ප්‍රායෝගික අපහසුතාවය ඇති බවද, එහෙත් ඉදිරියේදී මෙම | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | නියමිත තැනැත්තන්ට/ ආයතනයට මුදල් ලැබුණේද යන්න පිළිබඳව තහවුරුවක් නොවීය. | ක්‍රමවේදය අනුගමනය කිරීමට අවශ්‍ය කටයුතු කරන බව | |
| (ඇ) | 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:8 වගන්තිය | කොන්ත්‍රාත් වැඩ වෙනුවෙන් ඇස්තමේන්තු කොන්ත්‍රාත් වැඩ වටිනාකමින් සියයට 5කට නොඅඩු කාර්යසාධන බැඳුම්කරයක් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගත යුතු වුවද, NEMO ආයතනයට පිරිනමන ලද කොන්ත්‍රාත් සඳහා කාර්ය සාධන බැඳුම්කර ලබා ගෙන නොතිබුණි. | 2008 ජනවාරි 11 දිනැති අංක 8/0173/344/002 දරන ආමාත්‍ය මණ්ඩල සංදේශය හා 2008 පෙබරවාරි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය නිර්මාණ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉටුකරනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සඳහා කාර්යසාධන හා අත්තිකාරම් බැඳුම්කර ලබාදීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සිදු කර ඇති බැවින් සේනාංකය විසින් NEMO ආයතනයෙන් බැඳුම්කර ලබා නොගත් බව | එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව උප කොන්ත්‍රාත් යටතේ සිදුකරනු ලබන කාර්යයන් සඳහා මෙම සහනය අදාල නොවන බැවින් NEMO ආයතනය උප කොන්ත්‍රාත් ලබාදුන් කොන්ත්‍රාත් කරුවන්ගෙන් කාර්යසාධන බැඳුම්කර ලබාගත යුතුවීම. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 6.5.3.වගන්තිය | වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද සේනාංකය විසින් 2015,2016,2017 හා 2018 වර්ෂයන්හි වාර්ෂික වාර්තාවන් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බව . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ii) 8.3.9.වගන්තිය | සංස්ථාවක් සතු සම්පත් රේඛීය අමාත්‍යාංශයේ හෝ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ලබාදීමට අවසර නොමැති වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සේනාංකයේ කාර්ය මණ්ඩලයෙන් 03 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතන වෙත මුදා හැර තිබූ අතර ඔවුන්ගේ වැටුප් හා දීමනා ලෙස රු.505,669 ක් සේනාංකය විසින් වැයකර තිබුණි. | අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව සේනාංක කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකු වෙනත් ආයතනවලට අනුයුක්ත කළ බව. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

## 2.1 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නව මධ්‍යස්ථාන 12 ක් ආරම්භ කිරීම අත්‍යවශ්‍ය හා හදිසි කටයුත්තක් ලෙස සලකා භාණ්ඩ මිලදී ගෙන තිබුණද එම මධ්‍යස්ථාන ආරම්භ කිරීම සිදු නොවීම නිසා මිලදී ගත් භාණ්ඩ ගබඩාකර තැබීම වෙනුවෙන් ගබඩා කුළී, රක්ෂණ ගාස්තු, ආරක්ෂක සේවා ගාස්තු, වැටුප් හා කෘමින් මර්ධනය කිරීමේ ගාස්තු වශයෙන් 2019 මැයි දක්වා රු.5,147,125 වියදම් කර තිබුණි. | 2017 වර්ෂයේ අවසන් භාගයේදී නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැලසුම් කරමින්, එවකට සිටි අධ්‍යක්ෂවරුන්ගේ උපදෙස් මත එම මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සිදු කළද, 2016 හා 2017 වර්ෂයන්හිදී නියමු ව්‍යාපෘතිය යටතේ මධ්‍යස්ථාන ඉදිකිරීමට පැවරූ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ඉදි කිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් මිලදී ගනු ලැබූ භාණ්ඩ ඉදිරියේදී භාවිතයට ගත හැකි වන පරිදි සුරක්ෂිතව පවත්වා ගැනීමට රු.5,147,125/- ක වැයක් දැරීමට සිදු වූ බව | සැලසුම් කළ පරිදි මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකළ යුතු අතර අදාල ඉදිකිරීම් අවසන් වූ පසුව පමණක් අවශ්‍ය උපකරණ මිලට ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **2.2.1** | යොවුන් සේනාංකයේ මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති ඉඩම් | | |
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට සේනාංකය විසින් ප්‍රාදේශීයව පුහුණු මධ්‍යස්ථාන 49 ක් පවත්වාගෙන ගොස් තිබූ අතර, එම මධ්‍යස්ථානවලට අදාල ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 116.8769 විය. රජයේ දෙපාර්තමේන්තුවලට ඉඩම් ලබා දීම පිළිබඳ සහතික මගින් මධ්‍යස්ථාන 06 කට අදාලව ඉඩම් හෙක්ටයාර් 10.8859 සේනාංකයට පවරා දී තිබුණු නමුත් ඒවායේ වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සේනාංකය ආරම්භයේදී ප්‍රාදේශීය ලේකම්වරු (රජය),හා රාජ්‍ය ආයතන භාරයේ තිබූ හිස් ඉඩම් මෙන්ම ගොඩනැගිලිද සහිත ඉඩම් ලබා ගෙන පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කළද, එම ඉඩම් හා ගොඩනැගිලි විධිමත්ව පවරා ගැනීමක් සිදු කර නොමැති බවද, මේ වන විට මෙම ඉඩම් විධිමත්ව පවරා ගැනීමට අදාල කටයුතු සිදු කරමින් පවතින අතර 2018 දෙසැම්බර් 31 වන විට පුහුණු මධ්‍යස්ථාන 06 ක් පිහිටුවා තිබූ ඉඩම් විධිමත්ව පවරා ගැනීමට හැකි වූ නමුත් මෙම ඉඩම් රජයේ දෙපාර්තමේන්තුවලට ඉඩම් ලබා දීමේ සහතික මගින් පවරා දීම සිදු කරනු ලබන්නේ සේනාංකය අයත් රේඛීය අමාත්‍යාංශය වෙතබැවින් එහි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකළ බව. | ඉඩම් විධිමත්ව පවරා ගැනීමට හා ගිණුම්ගත කිරීමට අදාල කටයුතු සිදු කළ යුතුවීම. |
| (ආ) | මධ්‍යස්ථාන 35 කට අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු ඉතා සෙමින් ක්‍රියාත්මක වෙමින් තිබුණි. | නිතර සිදු වන අමාත්‍යාංශ වෙනස්වීම් ආදී කරුණු හේතුවෙන් පවරා ගැනීමේ කටයුතු වල ප්‍රමාද වීම් සිදු වන බව. | පවරා ගැනීමට අදාල කටයුතු කාර්යක්ෂමව සිදු කළ යුතුවීම. |
| (ඇ) | වෙනත් ආයතනවලට අයත් ඉඩම්වල පිහිටි ගොඩනැගිලිවල මධ්‍යස්ථාන 08 ක් පවත්වාගෙන ගොස් තිබුණි. | වෙනත් ආයතනවලට අයත් ඉඩම්වල දිවුලපිටිය, හගුරන්කෙත, සූරියවැව, කින්නියා, කැකිරාව, මුතූර්, දෙහිඅත්තකණ්ඩිය හා අම්පාර යන පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබයි. එම මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සේනාකය වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | පවරා ගැනීමට අදාල කටයුතු කාර්යක්ෂමව සිදු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නමුත් මෙම මධ්‍යස්ථාන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි ගොඩනැගිලි හා ගොඩනැඟිලි වැඩි දියුණු කිරීම් වශයෙන් රු.128,934,770 ක් වැය කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට නොනිමි ප්‍රාග්ධන වැඩ වශයෙන් රු.1,694,222,933 ක් වැය කර තිබුණි. | එම මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය සේනාංකය වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බැවින් මධ්‍යස්ථාන වෙනුවෙන් ගොඩනැගිලි වැඩි දියුණු කිරීම් සිදු කළ බව | පවරා ගැනීමට අදාල කටයුතු කාර්යක්ෂමව සිදු කළ යුතුවීම. |

**2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

**2.3.1 පුහුණු ලාභීන් බඳවා ගැනීම හා පුහුණු කිරීම**

-------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී සේනාංකය විසින් පාඨමාලාවන් පැවැත්වීමට පළමු කණ්ඩායම 2017 ජනවාරි සිට ජුනි දක්වාත්, දෙවන කණ්ඩායම 2017 සැප්තැම්බර් සිට 2018 පෙබරවාරි දක්වාත් සිදුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුල පාඨමාලා පවත්වා නොතිබුණු අතර එක් කණ්ඩායමක කාලය මාස 03 දක්වා අඩු කර 2018 ජුනි සිට අගෝස්තු දක්වාද, ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වාද ලෙස පාඨමාලා පවත්වා තිබුණි. පාඨමාලා කාලය පසුගිය වසර තුන ඇතුළත අවස්ථා දෙකකදී සංශෝධනය කර තිබුණද, ඒ සඳහා වූ විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2017 ජනවාරි සිට 2018 පෙබරවාරි දක්වා, 2017 වර්ෂයට අදාල කණ්ඩායම් 02ක් සඳහා පුහුණු පාඨමාලාව පැවැත්වූ බැවින් මාස 06ක පාඨමාලා 02ක් 2018 වසර තුළ පැවැත්වීමේ අපහසුතාවයත්, අරලියගහමන්දිරයේදී පැවති සාකච්ඡා අනුව කෙටි කලකින් පුහුණුලාභීන්/ලාභිනියන් වෘත්තීය පුහුණුවට යොමු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන එවකට සිටි අධ්‍යක්ෂතුමාගේ උපදෙස් මත මාස 03ක පාඨමාලා දෙකක් පැවැත්වීමට සැලසුම් කරන ලදී. මෙයට ඉහතද අග්‍රාමාත්‍ය ජේෂ්ඨ උපදේශකවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡා තුලදීද පාඨමාලා කාලය අඩු කිරීමට යෝජනා විය. එහෙත් අප්‍රේල් මස 05 වැනි දිනෙන් පසුව 2018 පළමු පාඨමාලාව ආරම්භ කරන අවස්ථාව දක්වා ජාතික යොවුන් සේනාංක සභාව නොපැවැත්වූ බැවින් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට නොහැකිවූ බව. | නිසි ඇගයීමකින් හා විධිමත් අනුමැතියකින් පසු සංශෝධනයන් සිදු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථාන 49 සඳහා කණ්ඩායම් දෙකකට පුහුණුලාභීන් 7,271ක් බඳවා ගෙන තිබුණි. ඉන් 1,883 ක් එනම් බඳවාගත් පුහුණුලාභීන්ගෙන් සියයට 26 ක් පාඨමාලාව හැර ගොස් තිබුණු අතර පාඨමාලාව සාර්ථකව නිමකල සංඛ්‍යාව 5,388ක් විය. | සමාලෝචිත වර්ෂය සඳහා මධ්‍යස්ථාන 49 සඳහා 2019 පළමු කණ්ඩායමට 3750 ක්ද දෙවන කණ්ඩායමට 3750ක්ද වශයෙන් කණ්ඩායම් දෙක සඳහා පුහුණුලාභීන් 7500 ක් බඳවා ගැනීමට සැලසුම් කළ බවද, ඒ අනුව කණ්ඩායම් 2 සඳහා පුහුණුලාභින් 7271ක් බඳවා ගෙන ඇති බවත් එය අපේක්ෂා කල ප්‍රමාණයෙන් සියයට 97 ක් බව.<br>එමෙන්ම පාඨමාලාව සාර්ථකව නිමකළ සංඛ්‍යාව 5388ක් බවද, ඒ අනුව පාඨමාලාවේ සාර්ථකවය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 4.3 කින් වර්ධනය වී ඇති බව. | සේනාංකය මීලදී ගැනීම් සිදුකිරීමේදී මධ්‍යස්ථානයකට සිසුන් 200ක පදනමින්ද, සිසුන් බඳවාගැනීමේදී එය සිසුන් 75 ක පදනමින්ද සිදුකිරීම පිළිගතනොහැකි බැවින් සැලසුම්කිරීම් නිවැරදිව සිදුකළ යුතු අතර පුහුණුලාභීන් පාඨමාලාව හැරයාම අවම මට්ටමක පවත්වාගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පළමු කණ්ඩායම සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවූ බැවින් කන්තලේ මධ්‍යස්ථානය සඳහා පළමු කණ්ඩායම බඳවාගෙන නොතිබුණි. | කන්තලේ මධ්‍යස්ථානයේ පළමු කණ්ඩායම සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවූ බැවින් පාඨමාලාව ආරම්භ නොකිරීමට එවකට සිටි අධ්‍යක්ෂවරයා තීරණය කරන ලදී. | ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවීමට හේතු වූ කරුණු සොයා බලා ඒසඳහා පිළියම් යෙදිය යුතුවීම. |
| (ඈ) | එක් පන්ති කාමරයකට සිසුන් 50 බැගින් පන්ති කාමර 4 ක් සඳහා පහසුකම් මධ්‍යස්ථානවල සලසා තිබුණි. 2018 පළමු කණ්ඩායමට අදාලව මධ්‍යස්ථාන 12 කද දෙවන කණ්ඩායමට අදාලව මධ්‍යස්ථාන 35 කද සිසුන් සංඛ්‍යාව 50 ට අඩු බැවින් මධ්‍යස්ථානවල සම්පත් ඌන උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය. තවද, එක් එක් මධ්‍යස්ථානය වෙනුවෙන් පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් මෙම මධ්‍යස්ථානවල පුහුණුලාභීන් සංඛ්‍යාව අඩුවීමට සාපේක්ෂව පිරිවැයේ අඩු වීමක් සිදුවීදැයි පරික්ෂා කළ නොහැකි විය. | සාමාන්‍යයෙන් පළමු පාඨමාලාව ජනවාරි මාසයේදී ආරම්භ වන අතර එයට විශාල සිසු සහභාගිත්වයක් දැකිය හැකි බැවින් 50 දෙනෙකුගෙන් සමන්විත පන්තියක් මෙහෙයවීම ප්‍රායෝගිකව අපේක්ෂා කල හැකි වුවද, දෙවන පාඨමාලාව සඳහා සහභාගිත්වය අඩු වන බැවින් එක් පන්තියක් සඳහා 50 දෙනෙක් අපේක්ෂා කල නොහැකි බවද,2018 වසරේ පළමු පාඨමාලාව ආරම්භ වුයේද ජුනි මාසයේදී බැවින් ඉහත ආකාරයේ විශාල සිසු සහභාගීත්වයක් අපේක්ෂා කළ නොහැකි බව | මධ්‍යස්ථානය වෙනුවෙන් පිරිවැය ගණනය කිරීමේ ක්‍රමවේදයක්හඳුන්වාදී මධ්‍යස්ථානය සතු සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කළ යුතුවීම. |

## 2.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්ගේ යැයි විගණනයට ඉදිරිපත් කළ අංක බීඞී/ එන්වයිසී/සිආර්/2018 හා 2018 ජුනි 22 දින ලිපියට අනුව දිනකට රු.325 ක් හා උපරිමය රු.6,500 ක උපරිමයකට යටත්ව දෛනික වියදම් දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණද, අතිරේක අධ්‍යක්ෂ පුහුණු හා සංවර්ධනගේ 2018 ජුලි 02 දින එන්වයිසී/03/1/8 ලිපිය මගින් ලිපියේ දින සිට දිනක ආහාර වියදම රු.225 ලෙස දක්වා තිබුණි. එමෙන්ම පුහුණු දීමනාව රු.125 ක් ලෙසද දක්වා තිබුණි. මේ පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | | |
| (අ) | දෛනික දීමනාව, ආහාර දීමනාව හා පුහුණු දීමනාව ලෙස කොටස් දෙකකට බෙදීම සඳහා වු අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2018.06.29 දිනැති සේනාංක අධ්‍යක්ෂවරයා විසින් අමාත්‍යාංශය ලේකම් වෙත යොමු කරන ලද ලිපිය මගින් දිමනාව වැඩිකිරිමට ඉල්ලා ඇත. මේ සඳහා අදාල අනුමැතිය ලැබෙන තෙක් සභාවේ අනුමැතිය මත අනුමත ප්‍රතිපාදන තුළ එක් පුහුණුලාභියකුට දිනකට රු.200 ක උපරිමයකට යටත්ව ආහාර ලබාදීම හා රු.125ක දීමනාවක් ලබා දීමට කටයුතු කරන ලද බව | දෛනික වියදම් දීමනාව, ආහාර හා පුහුණු වශයෙන් කොටස් දෙකක් වශයෙන් ලබාදීමේ විධිමත් අනුමැතියක් මත සිදුවිය යුතු වීම. |
| (ආ) | ඉහත අතිරේක අධ්‍යක්ෂකගේ ලිපියට අනුව ආහාර සඳහා රු.225ක් ද දෛනික දීමනාව සඳහා රු.125 ක් ද වු විට එය රු.350 වන නිසා දිනකට අනුමත සීමාව රු.25කින් ඉක්මවා තිබුණි. | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්නා තෙක් සභාවේ අනුමැතිය මත රු.25.00 ක් අමතර මුදලක් ආහාර දීමනා ලෙස ලබාදීමට කටයුතු කර ඇත. මෙම දීමනාව ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය නොලැබුණු බැවින් පුහුණුලාභීන් වෙත ගෙවනු ලබන දීමනාවෙන් ඔවුන්ගේ කැමැත්ත මත අදාල මුදල අය කර ගනිමින් සැපයුම්කරු වෙත ගෙවීමට කටයුතු කර ඇති බව. | භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුවීම. |

## 2.5 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. මිලියන 17.6 ක් උපයෝජනය නොකළ අරමුදල් නිරීක්ෂණය වූ අතර එය චීන භාෂා විද්‍යාගාර 3 ක් ආරම්භ කිරීම සඳහා 2016 වර්ෂයේදී ලබාදී තිබුණු රු. මිලියන 13 ක් හා සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු රු. මිලියන 4.6 කින් සමන්විත විය. | ගාල්ල මධ්‍යස්ථානයේ පන්ති කාමර සැකසීම නිම කර ඇති අතරවෙන්නප්පුව මධ්‍යස්ථානයේ වැය ඇස්තමේන්තුව ලබාගෙන ඉදිරි කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දීමට සැලසුම් කර ඇති අතර යක්කල මධ්‍යස්ථානය, ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති බව | අරමුදල් නිෂ්ක්‍රියව නොතබා අදාල කාර්යයට කාර්යක්ෂමව යොදාගත යුතු වීම. |
| (ආ) | නියමු ව්‍යාපෘතිය යටතේ 2017 දෙසැම්බර් 30 දින ශබ්ද විකාශන යන්ත්‍ර කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් සේනාංකය විසින් වැය කරන ලද රු.2,072,139 ක් එම ශබ්ද විකාශන යන්ත්‍රවල පැවති දෝෂයක් නිසා ප්‍රතික්ෂේප කිරිම හේතුවෙන් එය සේනාංකය වෙත 2018 ඔක්තෝබර් 11 දින ප්‍රේෂණය කරන ලද නමුත් සේනාංකය විසින් එම යන්ත්‍රවල අදාල අවශ්‍යතාව සපුරා නොගෙන එම මුදල අමාත්‍යාංශය වෙත 2018 දෙසැම්බර් 27 දින ආපසු ලබාදී තිබුණි | නව පුහුණු මධ්‍යස්ථාන අවශ්‍යතාසඳහා ශබ්ධ විකාශන කට්ටල 12ක් සපයා ගැනීමට සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවට සිදුකල ඇණවුමට අනුව ශබ්ධ විකාශන කට්ටල 12 ක් සේනාංකය වෙත සපයා තිබිණි. භාණ්ඩ සැපයීමේදී වංචනික අයුරින් ක්‍රියාකර ඇති බව අනාවරණය වීම හේතුවෙන් එම භාණ්ඩ වටිනාකම නැවත සේනාංකය වෙත ලබාදුන් බවටත්, නමුත් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම හේතුවෙන් වර්ෂය අවසානයේ අමාත්‍යාංශ උපදෙස් මත රාජ්‍ය අදායමට බැර කිරීමට කටයුතු කළ බව. | භාණ්ඩවල සැබෑ අවශ්‍යතාවය හඳුනාගත යුතු අතර ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව සැලසුම් සිදුකල යුතුවීම. |

## 2.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට එකක් රු.650,000 බැගින් මිලදී ගත් ත්‍රිරෝද රථ 18 ක් විගණිත දිනය වූ 2019 අගෝස්තු 20 දින වනවිටත් භාවිතයට ගෙන නොතිබුණි. විගණනය විසින් කරන ලද විමසීම්වලින් අනතුරුව 2019 දෙසැම්බර් 02 දිනැති ත්‍රී රෝද රථ 3 ක් සේනාංකයේ පරිබාහිර ආයතනයක් වූ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත භාරදී තිබුණි. | 2018 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථානවලට බෙදා දීමට 2017 දෙසැම්බර් මස 31 දින වන විට ත්‍රීරෝද රථ 18 ක් ගබඩාවේ ගාල් කර තිබූ නමුත් මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ නිසා එසේ ගාල්කර තබන ලද ත්‍රීරෝද රථ 18 න් 13 ක් මේ වන විට පුහුණු මධ්‍යස්ථාන වෙතද අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඉතිරි ත්‍රීරෝද රථ අතුරින් රථ 03 ක් | සැලසුම් කළ පරිදි භාවිතයට ගත යුතුවීම. |

කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙතද ඉතිරි ත්‍රීරෝද රථ සේනාංක මූලස්ථාන වාහන සංචිතයේ රාජකාරී සඳහා යොදවා ඇති බව.

**2.7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

**2.7.1 නවතා දමන ලද ඉදිකිරීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීගහකිවුල හා පැල්මඩුල්ල යෝජිත යොවුන් සේනාංක මධ්‍යස්ථාන ඉදිකිරීම වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් පිළිවෙලින් රු.19,662,001 ක් හා රු 17,018,461 ගෙවීම් සිදුකර තිබුණු නමුත් ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්න මත එම ඉදිකිරීම් අවලංගුකර ඇතත් අත්තිකාරම් මුදල් මේ දක්වා අයකරගෙන නොතිබුණි. | ඉඩම් අයිතිය පිළිබඳ ඇතිවූ ප්‍රශ්න මත අවලංගු කළ බවද, අත්තිකාරම් මුදල් එම කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදි කරනු ලබන අනෙකුත් මධ්‍යස්ථාන ඉදිකිරීම්හි බිල්පත් මගින් පියවා ගැනීමට සැලසුම් කර ඒ පිළිබඳව අදාල කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කළ බව. | කොන්ත්‍රාත්තුව සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | ඉංජිනේරු ඇස්තමේන්තුව රු.179,058,171 ක් වූ කොන්ත්‍රාත් පුද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබූ හලාවත කල්පිටිය මධ්‍යස්ථානවල ඉදිකිරීම් කොන්ත්‍රාත් 2 ක් භෞතික ප්‍රගතිය සියයට 40 හා මූල්‍ය ප්‍රගතිය සියයට 28 ක් ව තිබිය දී අවලංගුකර තිබුණි. එම ආයතනයට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.37,302,688 ලබා දී තිබුණු අතර කළ වැඩ සඳහා ගෙවීම් කිරීමේදී අත්තිකාරම් බැදුම්කර නිරවුල් කර ගැනීමෙන් අනතුරුව තවදුරටත් ඉහත අත්තිකාරම් මුදලින් රු.4,238,300 ක් අයකර ගත නොහැකි වී තිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව එම පුද්ගලික ආයතන වෙත ලබාදුන් කල්පිටිය සහ හලාවත මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සලකා බලා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත එම ඉදිකිරීම් අවලංගු කිරීම් සිදු කළ බව. | කොන්ත්‍රාත්තුව සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | වැලිමඩ මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු, ඉඩමේ පිහිටීම හා භූ විෂමතා හේතුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම්වල අස්ථාවර අවදානම් තත්ත්වයක් පැන නැගීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇතත් අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු.19,259,020ක් අයකර ගෙන නොතිබුණි. | වැලිමඩ පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අවලංගු කිරිමට තීරණය කර ඇති හෙයින් අත්තිකාරම් ඇපකරයන් පියවා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | කොන්ත්‍රාත්තුව අවලංගුකර ඇති බැවින්කොන්ත්‍රාත්තුව සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. |

## 2.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2.8.1** දික්වැල්ල, හම්බන්තොට, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාමය හා සූරියවැව යොවුන් සේනාංකවල ඉදිකිරීම් ව්‍යාපෘති | | |
| නිවාස හා ඉදිකිරීම් ගරු ඇමැතිතුමා විසින් 2016 ජුලි 28 දින ඉදිරිපත් කරන ලද අංක 16/1501/736/034 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2016 අගෝස්තු 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණි. මෙම අනුමැතියට අනුව යොවුන් සේනාංකය විසින් 2016, 2017 සහ 2018 වර්ෂවලදී යොවුන් සේනාංක මධ්‍යස්ථානවල ඉදිකිරීමට යෝජිත ඉදිකිරීම් ව්‍යාපෘති මිල කැඳවීමකින් තොරව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට පවරා තිබුණි. මේ පිළිබඳව පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4(ආ) ඡේදය යටතේ හඳුනාගෙන ඇති වැඩ මෙන්ම ඉදිරියේදී හඳුනාගනු ලබන වැඩ පිළිබඳව අධ්‍යයනය කර එකී වැඩ කොටස් මිල කැඳවීමකින් තොරව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට පැවරීම සඳහා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත නිර්දේශ කිරීම සඳහා නිළධාරී කමිටුවක් පත් කිරීමට යෝජනා කර තිබුණු අතර ඊට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. නමුත් එවැනි නිළධාරි කමිටුවක් පත්කළ බවට හෝ යොවුන් සේනාංකය විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට පවරා තිබුණු කොන්ත්‍රාත් සඳහා ආර්ථික කළමනාකරණය පිළිබඳව | අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත නිර්දේශ ලබාදීම සඳහා ජාතික යොවුන් සේනාංකය විසින් නිලධාරී මණ්ඩලයක් පත්කර නොමැති අතර, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණ ලිපියට අනුව කටයුතු කළ බව. | අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් එම යෝජනා ක්‍රියාත්මක කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කළ බවට හෝ එකී යෝජනා සඳහා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ අනුමැතිය ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය. | | |
| (ආ) | සංදේශයේ 4(ඇ) ඡේදය යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීමට අදාලව පවතින රුපියල් මිලියන 25 ක සීමාව රුපියල් මිලියන 50 දක්වා වැඩිකිරීම සඳහා ඉහත 4(ආ) යටතේ පත්කිරීමට යෝජිත නිළධාරී කමිටුවේ නිර්දේශ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවට ඉදිරිපත් කිරීමට අනුමැතිය ලැබී තිබුණු අතර එවැනි නිර්දේශයක් ඉදිරිපත් කළ බවට හෝ ඒ සඳහා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ අනුමැතිය ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. එසේම ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් යොවුන් සේනාංකයේ අධ්‍යක්ෂ වෙත 2016 සැප්තැම්බර් 06 දින යොමුකර තිබුණු අංක එම්එන්පීඊඒ/වයිඒඩී/11/01(V01 ii) දරන ලිපිය මඟින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට සෘජු කොන්ත්‍රාත් පැවරීමේදී එක් යොවුන් සේනාංක මධ්‍යස්ථානයක් තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් රුපියල් මිලියන 25 ක සීමාවට යටත්ව සිදුකිරීමට දන්වා තිබුණි. නමුත් දකුණු පළාතේ ක්‍රියාත්මක යොවුන් සේනාංක මධ්‍යස්ථාන 5 ට අදාළ එකතුව රු.362,474,376 ක කර්මාන්ත සෘජුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට පවරා තිබුණි. | අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත නිර්දේශ ලබාදීම සඳහා ජාතික යොවුන් සේනාංකය විසින් නිලධාරී මණ්ඩලයක් පත්කර නොමැති අතර, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණ ලිපියට අනුව කටයුතු කළ බව. | අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් එම යෝජනා ක්‍රියාත්මක කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත් පැවරීමේදී ඒ සඳහා යොවුන් සේනාංක සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගත් බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. | උප කොන්ත්‍රාත් පිරිනැමීමට යොවුන් සේනාංකය විසින් ක්‍රියාකර නොමැති අතර, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් එසේ උප කොන්ත්‍රාත් ලබාදී ඇති ව්‍යාපෘති සම්බන්ධව විස්තර ලබා ගැනීමට ඉල්ලා ඇතත් මේ දක්වා අදාල විස්තර ලබාදී නොමැති බව. | අදාල අනුමැතින් අනුව කටයුතු කළ යුතුවීම. |
| (ඈ) | ඉදිකිරීම් හා ඉංජිනේරුසේවා ගරු ඇමතිතුමා විසින් 2008 ජනවාරි 11 දින ඉදිරිපත් කරන ලද අංක 8/0173/344/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2008 පෙබරවාරි 06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබිණි. මෙම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය නිර්මාණ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් පවත්නා සම්පත් සීමාවන් තුළ සෘජුව ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළව කාර්යසාධන හා අත්තිකාරම් බැඳුම්කර ලබාදීමෙ අවශ්‍යතාවයෙන් නිදහස් කර තිබුණි. නමුත් උප කොන්ත්‍රාත් යටතේ ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම්වලට මෙම නිදහස අදාළ නොවන බව දක්වා තිබුණි. මෙම අමාත්‍ය මණ්ඩල තීරණය පදනම් කරගෙන ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට පවරා තිබුණු සියලු කොන්ත්‍රාත් උප කොන්ත්‍රාත් ලබාදී තිබුණු බව විගණනයේදී තහවුරු විය. | උප කොන්ත්‍රාත් පිරිනැමීමට යොවුන් සේනාංකය විසින් ක්‍රියාකර නොමැති අතර, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් එසේ උප කොන්ත්‍රාත් ලබාදී ඇති ව්‍යාපෘති සම්බන්ධව විස්තර ලබා ගැනීමට ඉල්ලා ඇතත් මේ දක්වා අදාල විස්තර ලබාදී නොමැති බව. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ඉ) | ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ගන්නා අවස්ථාව වන විට ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේම කොටසක් ලෙස පැවතියත්, නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යවරයා විසින් 2016 ජනවාරි 13 ඉදිරිපත් කරන ලද අංක 16/0082/736/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2016 ජනවාරි 27 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල | ඉහත අමාත්‍ය මණ්ඩල තීරණ ලිපියට අනුව කටයුතු කර ඇති බව. | යම් අවිනිශ්චිත තාවයක් පවතීනම් අදාල බලධාරීන් දැනුවත් කර සාධනීය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතියට අනුව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙනමම කළමනාකරණ කමිටුවක් යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ පවතින වෙනම ව්‍යාපෘතියක් ලෙස පිළිගෙන ඇති බැවින් 2008 පෙබරවාරි 06 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අදාළ කරගැනීමේ හැකියාවද නිශ්චිත නොවීය. | | |
| (ඊ) | ගිවිසුම් කොන්දේසි ලෙස අයිසීටීඒඩී/එස්බීඩී/04 හි කොන්දේසි අදාළ වන බව දක්වා තිබුණි. එස්බීඩී/04 හි කොන්දේසි අංක 4.4 අනුව සම්පූර්ණ කාර්යය උප කොන්ත්‍රාත් ලබාදිය නොහැකි බවත්, කොටසක් උපකොන්ත්‍රාත් දීමේදී ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබාගත යුතු බවත් දැක්වේ. නමුත් කිසිදු විධිමත් අනුමැතියක් රහිතව ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට කොන්ත්‍රාත් පවරන ලද දකුණු පළාතට අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත් උප කොන්ත්‍රාත් දී තිබුණි. මෙහිදී සේනාංකය විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට කොන්ත්‍රාත් පවරන ලද අගයන්ට වඩා සියයට 45 සිට 35 දක්වා පරාසයන්ගෙන් අඩු වටිනාකම් මත උප කොන්ත්‍රාත් පවරා තිබිණි. | ඉහත අමාත්‍ය මණ්ඩල තීරණ ලිපියට අනුව කටයුතු කර ඇති බව. | ගිවිසුම් කොන්දේසිවලට අනුව කටයුතු කළයුතු වේ. |
| (උ) | කොන්ත්‍රාත් ගිවිසුමේ දත්ත පත්‍රිකාවේ උප වගන්ති 18.2 අනුව ලබාගත යුතු බව දැක්වෙන රක්ෂණයන් කිසිවක් කොන්ත්‍රාත්කරු විසින් ලබාදුන් බවට සාක්ෂි ඉදිරිපත් නොවිය. ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට අදාල රක්ෂණ සහතික ලබාදී නොතිබුණි. මෙම රක්ෂණ සහතික යටතේ ලබාදිය යුතු | අදාල කොන්ත්‍රාත් ගිවිසුමේ දත්ත පත්‍රිකාවේ උප වගන්ති 18.2 අනුව ලබාගත යුතු බව දැක්වෙන රක්ෂණ සහතිකය ලබාදීම පිළිබඳව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අංක 06-04-33-2018 හා 2018.12.18 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර ඇතිබව. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | මූලික ගිවිසුම් වටිනාකමින් සියයට 10 ක අගයක වෘත්තීය හානි පූර්ණ රක්ෂණ සහතිකය (professional Indemnity Insurance) කිසිදු ගොඩනැගිල්ලකට අදාළව ලබාදී නොතිබුණු අතර ගෙවීම් සහතික කිරීමේදි මෙම රක්ෂණ සහතික ලබා නොදීම කෙරෙහි අවධානයක් යොමුකර නොතිබුණි. | | |
| (ඍ) | දකුණු පළාත තුළ පිහිටි යොවුන් සේනාංක මධ්‍යස්ථාන 2018 අගෝස්තු 14 දින භෞතිකව පරික්ෂා කරන ලද අතර ඉදිකිරීම් දුර්වලතා කිහිපයක් එහිදී නිරික්ෂණය විය. | NEMO ආයතනය මගින් සිදු කරන ලබන ඉදිකිරීම් සම්බන්ධව ඉදිරි උපදෙස් පතා අමාත්‍යාංශ ලේකම් ඇමතු අතර මේ සබැඳිව නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කර එම කමිටුවේ නිර්දේශ උපයෝගී කරගනිමින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බවද, ඒ අනුව NEMO ආයතනය සබැඳිව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩව කළයුතුවීම. |
| (එ) | යොවුන් සේනාංකයේ දකුණු පළාත තුළ පිහිටි මධ්‍යස්ථානවලින් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක මධ්‍යස්ථාන 05 හි සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීම් කිරීමේදී ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ගෙවන ලද එකතුකළ අගය මත බදු මුදල් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කරන මෙන් ඉල්ලීම් කළද 2019 මාර්තු 15 දින දක්වා එකී තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ගෙවන ලද එකතු කල අගය මත බදු මුදල් වෙනුවෙන් ඉදිරිපත් කල ඉන්වොයිස් පත් පිළිබඳ තොරතුරු එම ආයතනය මගින් ඉල්ලීම් සිදු කල ද මේ වන තෙක් තොරතුරු ලබා දීමක් සිදු නොකළ බව. | ආයතනය විසින් නිවැරදි හා කාලීන තොරතුරු ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළයුතු වීම. |
| (ඒ) | මෙම ඉදිකිරීම් කඩිනමින් නිමකිරීමේ අරමුණින් සැලසුම් කර සෘජුව කොන්ත්‍රාත් පවරා තිබුණද දකුණු පළාතට අදාළ ඉදිකිරීම් 2019 ජනවාරි 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. බොහෝ ඉදිකිරීම් වල භෞතික ප්‍රගතිය සියයට 35 ත් 40 ත් අතර මට්ටමක පැවතුණි. | NEMO ආයතනය සබැඳිව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරන බව. | ඉදිකිරීම් කඩිනමින් ඉදිකර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග තවදුරටත් ගතයුතු වීම. |

**2.8.2** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත යොවුන් සේනාංකයේ මධ්‍යස්ථාන ගොඩනැඟිලි ඉදිකිරීමේ නියමු ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ උපලේඛනයට අනුව කොන්ත්‍රාත් 131 ක් විය. මේ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | NEMO ආයතනයට ඉදිකිරීම් කොන්ත්‍රාත් 104 ක් සඳහා ලබා දුන් අත්තිකාරම් සඳහා අත්තිකාරම් ඇපකර ලබා ගෙන නොතිබුණු අතර එම අත්තිකාරම් ශේෂය 2018 දෙසැම්බර් 31 දිනට රු.115,905,951 ක් විය. | ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා ගරු ඇමතිතුමා විසින් 2008 ජනවාරි 11 දින ඉදිරිපත් කරන ලද අංක 8/0173/344/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2008 පෙබරවාරි 06 දින ආමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය නිර්මාණ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉටුකරනු ලබන ඉදිකිරීම් කර්මාන්ත සඳහා කාර්යසාධන හා අත්තිකාරම් බැඳුම්කර ලබාදීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම සිදු කර ඇති බැවින් අප ආයතනය මගින් NEMO ආයතනයෙන් බැඳුම්කර ලබා ගැනීම සිදු නොකරන ලදි. | එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව උප කොන්ත්‍රාත් යටතේ සිදුකරනු ලබන කාර්යයන් සඳහා මෙම සහනය අදාල නොවන බැවින් NEMO ආයතනය උප කොන්ත්‍රාත් ලබාදුන් කොන්ත්‍රාත් කරුවන්ගෙන් කාර්යසාධන බැඳුම්කර ලබාගත යුතුවීම. |
| (ආ) | ගෝමරන්කඩවල යොවුන් සේනාංක මධ්‍යස්ථානය ඉදිකිරීම් වෙනුවෙන් ලබා දී තිබුණු රු.19,527,110 ක් වූ අත්තිකාරමට අදාල අත්තිකාරම් බැඳුම්කර කල් ඉකුත් වී තිබුණි | මේ වන විට අත්තිකාරම් පියවාගෙන ඇති බැවින් අත්තිකාරම් ඇපකරයන් දීර්ඝ කර ගැනීමක් සිදු කර නොමැති බව. | අත්තිකාරම් බැඳුම්කර නිසිපරිදි දින දිර්ඝකරගැනිම් කළ යුතුවීම. |

## 2.9 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වාර්ෂික ඇස්තමේන්තුව අනුව සේනාංකයේ අනුමත කාර්ය මණ්ඩලය 761 ක් වුවද, 2018 දෙසැම්බර් 31 දිනට සේනාංකයේ අනුමත කාර්ය මණ්ඩලය 983 ක් සහ තත්‍ය කාර්ය මණ්ඩලය 758 ක්වූ අතර අනුමත ස්ථිර කාර්ය මණ්ඩලයෙන් 164 ක් හා කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයෙන් 61 ක් ඇතුළුව පුරප්පාඩු 225 ක් පැවති අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 23 ක් විය. | 2018 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 225ක් පැවතියද 2019 දී බඳවා ගැනීම් සිදු කළ බවද, පුරප්පාඩුව පැවති ඉංග්‍රීසි උපදේශක, තොරතුරු තාක්ෂණ උපදේශක හා සංවර්ධන සහකාර තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කළ බව. | පුරප්පාඩු පැවතීම සේනාංකයේ කාර්යසාධනය කෙරෙහි අයහපත් ලෙස බලපාන්නේ නම් කඩිනමින් බඳවාගැනීම් සිදුකිරීමටත් නොඑසේනම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරිමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය අනුව, සේනාංකයේ කාර්ය මණ්ඩලයේ ප්‍රධාන තනතුර වන "අධ්‍යක්ෂ" තනතුර ස්ථිර තනතුරක් වුවද ස්ථිර පත්කිරීමක් සිදු නොකොට දිගින් දිගටම ද්විතික පදනම මත බඳවා ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | 2002 අංක 21 දරන යොවුන් සේනාංක පනත 7 වන වගන්තිය මගින් සේනාංකයේ අධ්‍යක්‍ෂවරයා ලෙස අමාත්‍යවරයා විසින් සුදුසු යෝග්‍ය තැනැත්තකු පත් කරනු ලැබිය යුතු බව දක්වා ඇත. සේනාංකය අයත් අමාත්‍යංශයේ අමාත්‍යවරයාගේ නිර්දේශ සහිතව ලේකම්වරයා විසින් තනතුර සඳහා නිලධාරීන් පත් කරනු ලැබේ. ඒ අනුව අධ්‍යක්‍ෂ තනතුර සඳහා අවස්ථා 03 කදී ද්විතිය පදනම මත බඳවා ගැනීම සිදු කර ඇත. 2011 බඳවා ගැනීමේ පටිපාටියේ මෙම තනතුර දක්වා තිබුණද යොවුන් සේනාංක පනත එය අභිබවා ක්‍රියාත්මක වන බව දන්වා සිටිමි. | අදාල තනතුර සඳහා නිත්‍ය පදනම මත නිලධාරියකු යෙදවීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී ස්ථිර කාර්ය මණ්ඩලයේ 70 දෙනෙකු ඇතුළුව ආයතනයේ සේවකයින් 130 දෙනෙකු සේවය අතහැර ගොස් තිබුණි. මෙලෙස රැකියා හැරයාමේ ප්‍රවනතාව ඉහළ මට්ටමක පැවතීම, ආයතනයට පුහුණු ශ්‍රමය අහිමිවීමට මෙන්ම ආයතනයේ කාර්යක්ෂමතාවයටද අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය. | සේනාංකය සඳහා ස්ථිර පදනම මෙන්ම කොන්ත්‍රාත් පදනම මතද සේවකයින් බඳවා ගනු ලැබේ. සේනාංකයෙන් ලබා ගන්නා පත්වීම විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන හෙයින්ද, දිවයින පුරා මධ්‍යස්ථාන පිහිටුවා ඇති බැවින්ද රජයේ ස්ථිර විශ්‍රාම වැටුප් ලැබෙන රැකියාසඳහා යොමු වීමේ වැඩි ප්‍රවනතාවක් ඇති බව. | රැකියා හැරයාමේ ප්‍රවනතාව පහළ මට්ටමක පවත්වාගැනීම සඳහා කටයුතු කළ යුතුවීම. |

## 2.10 වාහන පද්ධතිය කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේනාංකය ත්‍රීරෝද රථ 78 ක්, යතුරු පැදියක්, ඩබල් කැබ් 04ක්, මෝටර් රථ 02ක් හා ලොරි රථයක් ද ඇතුළුව වාහන 86 ක් සමාලෝචිත වර්ෂයේදි භාවිතා කර තිබුණි. | ඩබල් කැබ් 04 ක්, මෝටර් රථ 02 ක්, ලොරි රථයක් හා යතුරු පැදියක් සේනාංක මූලස්ථානයේ හා ගබඩා භාණ්ඩ බෙදා හැරීමේ රාජකාරි සඳහාද, ත්‍රීරෝද රථ 51 ක් මධ්‍යස්ථානවල රාජකාරි කටයුතු සඳහා යොදවා ඇති අතර ඉතිරි ත්‍රීරෝද රථ 27, විවෘත කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථාන වලට බෙදාදීම සඳහා ගබඩාවේ ගාල් කර තබන ලදී. මේ වනවිට එම ත්‍රීරෝද රථ 27 න් 23 ක් මධ්‍යස්ථාන වෙතද ත්‍රීරෝද රථ 03 ක් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කුඩා ව්‍යාපාර අංශය වෙතද අනෙක් ත්‍රීරෝද රථය සේනාංකයේ මූලස්ථාන වාහන සංචිතයේ රාජකාරි සඳහා යොදවා ඇති බව | වාහන පද්ධතිය ඵලදායි අයුරින් කළමනාකරණය කළයුතුවීම. |
| (ආ) | වෙනත් ආයතනවලට අයත්, වාහන 07 ක් සේනාංකය විසින් භාවිත කරමින් තිබූ නමුත් මෙම මෝටර් රථවල නෛතික අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන 07 වෙනත් අමාත්‍යාංශවලට අයිති ඒවා බවද, 2015 පසු සේනාංකය විවිධ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ බැවින්, පවරා ගැනීම් කටයුතු නිසි පරිදි අවසන් කර ගැනීමට නොහැකි බව. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කරන ලද මෝටර් රථ 02 ක් හා 2017 වර්ෂයේදී ධාවනයෙන් ඉවත්කරන ලද මෝටර් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කල යුතු රථ හඳුනා ගැනීම, තක්සේරු කිරීම ආදී කටයුතු අවසන් කර ඇතත් වාහනයේ අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමට අදාළ අමාත්‍යාංශ වෙත යවා ඇති බව. | අපහරණ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුවීම. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ත්‍රීරෝද රථ 35 ක් ධාවනයේ යොදවා නොතිබුණු අතර එම ත්‍රීරෝදරථවල රක්ෂණය වෙනුවෙන් රු.556,443 ක් වැයකර තිබුණි. | 2018 වර්ෂයේදී නව මධ්‍යස්ථාන සඳහා මෙම ත්‍රීරෝද රථ බෙදා දීමට සැලසුම් කර තිබූ බැවින් මෙම ත්‍රීරෝද රථ 35 හි රක්ෂණ කටයුතු සිදු කර ඇත. නමුත් 2018 වර්ෂයේ දී මධ්‍යස්ථාන 08 ක වැඩ කටයුතු නිම කිරීමෙන් පසු ත්‍රීරෝද 08 ක් බෙදා දුන් අතර, විවෘත කිරීමට නියමිතව තිබූ මධ්‍යස්ථාන වල ඉදිකිරීම් කටයුතු සිදු කිරීම තව දුරටත් ප්‍රමාද වූ නිසා ඉතිරි ත්‍රීරෝද රථ 27 ගබඩාවේ ගාල් කරන ලදී. | අවම පිරිවැයක් යටතේ වත්කම් වල ප්‍රමාණවත් හා කාලීන ආරක්ෂාව සලසා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී වාහන 07 කට අදාලව වාහන අනතුරු 08 ක් සිදුවී තිබුණද වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එසේම වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසිප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ගිණුම් ඉදිරිපත් කළ යුතු වුවත් සේනාංකය 2015 හා 2016 වර්ෂවල ගිණුම් මාස විසිහතරක් හා 2017වර්ෂයේ ගිණුම් මාස විසිඑකක් ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණු අතර 2018 වර්ෂයේ ගිණුම් 2020 ජුනි 20 දිනවනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. | වරින් වර දේශපාලනික වෙනස් වීම් සමඟ සභාවේ සිදුවූ වෙනස් වීම් මත ගිණුම් අනුමත කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඒ ඒ වර්ෂයන්ට දාල ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇති බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

**3.2 සංයුක්ත සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 ප්‍රකාරව සේනාංකය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සැලසුම් සකස්කර ඇතත් එය විධිමත් සැලැස්මක් නොවූ බවත් සංයුක්ත සැලැස්මක් සැකසීමට ඉදිරියේදී කටයුතු කරන බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

## 3.3 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි අභ්‍යන්තර විගණනය විසින් ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පරීක්ෂා කර විගණන වාර්තා 83 ක්, කළමනාකරණය වෙත වාර්තා කර තිබුණු අතර එම වාර්තා සඳහා පිළිතුරු දීමේ ප්‍රමාදයක් නිරික්ෂණය විය. එනම් වාර්තා 05 ක් සඳහා පිළිතුරු ලබාදීමට වසරකට වඩා වැඩි කාලයක් ද, වාර්තා 21 ක් සඳහා මාස 06 කට වඩා වැඩි කාලයක් ද, වාර්තා 16 ක් සඳහා මාස 03 කට වඩා වැඩි කාලයක් ද ගතකර තිබුණි. | සේනාංකයේ 2018 වර්ෂයට අදාලව නිකුත් කර ඇති අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු මේ වන විට නිරවුල් කර ඇති බවද, විශේෂ පරීක්ෂණ මට්ටමේ ඇති විමසුම් 03 ක් නිරවුල් කරමින් පවතින බව | අභ්‍යන්තර විගණන විමසුම්වලින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු නිවැරදි කිරීමට අවධානය යොමු කරමින් අප්‍රමාදව පිළිතුරු ලබාදීම කළ යුතුවීම. |

## 3.4 විගණන කමිටුව

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඒඩී/12 හි 7.4.1 වගන්තිය ප්‍රකාරව, මාස තුනකට වරක්වත් විගණන කමිටුව පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී කමිටුව රැස්වී තිබුණේ එක් වතාවක් පමණි. | සභාවේ සංයුතිය වෙනස්වීම තුල විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය ද වෙනස් වීම හේතුවෙන් නව කමිටුවක් සභාවේ අනුමැතිය පරිදි පත් කර ගැනීමට නොහැකිවීම | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |